බප/කො/කලාප /ගුරුපා 26,
කලාප අධ්‍යාපන කාර්යාලය,
විතානගේ මාවත,
කොළඹ 02.
2025.09.30

කොළඹ අධ්‍යාපන කලාපයේ
පළාත් සභා පාසල්වල විදුහල්පතිවරුන් වෙත.

ගුරු සේවයේ වාර්ෂික ස්ථාන මාරු -2026

බස්නාහිර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ අංක WP/ED/EAD/07/01/වා.ස්.මා.-2025 දරණ හා 2025.09.08 දිනැති ලිපිය හා බැඳේ.

02.ඒ අනුව කොළඹ අධ්‍යාපන කලාපයේ පළාත් සභා පාසල්වල සේවය කරන ගුරු සේවයේ නිලධාරීන්ගෙන් ස්ථාන මාරු අයදුම්පත් කැඳවනු ලැබේ..

03.වාර්ෂික ස්ථාන මාරු ප්‍රධාන වර්ග 2 කි.

I.එකම පාසලේ වසර 09 කට වඩා වැඩි සේවා කාලයක් සහිත ගුරු භවතුන්ගේ අනිවාර්ය ස්ථාන මාරු.

II.ගුරු භවතුන්ගේ ඉල්ලීම් මත සිදු කෙරෙන ස්ථාන මාරු.

04.කොළඹ අධ්‍යාපන කලාපයේ පළාත් සභා පාසල්වල වාර්ෂික ගුරු ස්ථාන මාරු ක්‍රියාවලිය සාර්ථකව සිදු කිරීම සඳහා පහත උපදෙස් අනුගමනය කරන ලෙස කාරුණිකව දන්වමි.

I. 2025.12.31 දිනට එකම පාසලේ වසර 09 කට වඩා වැඩි සේවා කාලයක් සහිත ගුරු භවතුන් විසින ඊට අදාළ අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීම අනිවාර්ය වේ.(ඇමුණුම 01)

II.එකම පාසලේ වසර 09 ක් සම්පූර්ණ නොවුවද විවිධ හේතුන් මත ගුරු ස්ථාන මාරු ඉල්ලීම් කරනු ලබන 2020.12.31 දිනට පෙර පත්වීම් ලැබූ ගුරු භවතුන් පමණක් ඊට අදාළ අයදුම්පත්‍රය සම්පූර්ණ කල යුතුයි.(ඇමුණුම 02.)

-කලාපය තුල පිටපත් 01
-අන්තර් කලාප පිටපත් 02
-අන්තර් පළාත් පිටපත් 05
-ජාතික පාසල් පිටපත් 05

III.2020.12.31 දිනෙන් පසු පත්වීම් ලද ගුරු භවතුන්ගේ ස්ථාන මාරු අයදුම්පත් භාර නොගත යුතුය.

IV.පාසලේ වැටුප් ලේඛණයේ වැටුප් ලබන සියලුම ගුරු භවතුන්ගේ තොරතුරු (සැප්තැම්බර් මස වැටුප් ලේඛණය අනුව) එම පාසලේ සේවා කාලය වැඩිම ගුරු භවතාගේ සිට එම පාසලේ සේවා කාලය අඩුම ගුරු භවතා දක්වා අදාළ තොරතුරු ආකෘතිය (ඇමුණුම 03) නිවැරදිව සම්පූර්ණ කර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතුය.

V.සියලුම ගුරු භවතුන් වෙත මෙම ලිපිය පෙන්වා කියවීමට ලබා දී දුටු බවට අත්සන් ලබා ගෙන ගොනු කර තබා ගත යුතුය.

VI.පහත දැක්වෙන අදාළ ආකෘති පත්‍ර කොළඹ කලාප අධ්‍යාපන කාර්යාලයීය නිල වෙබ් අඩවිය වන cmbez.wp.gov.lk වෙබ් අඩවියට ප්‍රවේශ වීමෙන් බාගත කර ගත හැකිය.

- එකම පාසලේ වසර 09 කට වඩා වැඩි සේවා කාලයක් සහිත ගුරු ස්ථාන මාරු තොරතුරු ලබා ගැනිමේ ආකෘතිය (ඇමුණුම 01)

  ( ගුරු භවතා විසින් සම්පූර්ණ කර විදුහල්පති විසින් සහතික කර තිබිය යුතුයි.)

- වසර 09 සම්පූර්ණ නොවුවද ජාතික පාසල් , අන්තර් කලාප, අන්තර් පළාත් හා කලාපය තුල ස්ථාන මාරු ඉල්ලීම් සදහා වූ අයදුම්පත්‍රය.(ඇමුණුම 02.)
  (ගරු භවතා විසින් සම්පූර්ණ කර විදුහල්පති විසින් නිදහස් කරනුයේ අනු සහිතවද අනු රහිතවද යන්න පැහැදිලිව සටහන් කර සහතික කල යුතුයි.
- පාසලේ සැප්තැම්බර් මස වැටුප් ලේඛණය අනුව සිටින සියලුම ගුරු භවතුන්ගේ තොරතුරු ඇසුරින් විදුහල්පති විසින් සහතික කරන ලද ආකෘති පත්‍රය.(ඇමුණුම 03)

VII.<u>අන්තර් පළාත්</u> ගුරු ස්ථාන මාරු ඉල්ලුම්පත් ඉදිරිපත් කරන ගුරු භවතුන් මේ සමඟ එවන ඇමුණුමේ ඇති ලේඛණද ඉදිරිපත් කල යුතුයි.(අමුණුම 04)

VIII. සෑම අයදුම්පත්‍රයක්ම නිවැරදිව හා විධිමත් ලෙස සම්පූර්ණ කර තිබිය යුතු අතර එක් එක් පාසලට අදාල සියලුම අයදුම්පත්‍ර හා ගුරු තොරතුරු ආකෘති පත්‍ර කවරයක බහා විදුහල්පති විසින් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත 2025.10.10 දිනට පෙර භාරදිය යුතුයි.(කවරයේ වම් පස ඉහළ කෙළවර " වාර්ෂික ගුරු ස්ථාන මාරු -2026 " පාසලේ නම:................................ සටහන් කළ යුතුයි.)

IX.ගුරු භවතුන් විසින් පෞද්ගලිකව රැගෙන එනු ලබන අයදුම්පත් භාර ගනු නොලැබේ.

X.පාසලේ ගුරු තොරතුරු හා අයදුම්පත්‍ර වල නිවැරදි හා සත්‍ය තොරතුරු ඇතුළත් කර ඇති බවට විදුහල්පති විසින් පෞද්ගලිකව සෑහීමට පත්විය යුතු අතර,කලාප අධ්‍යාපන කාර්යාලයීය දත්ත පද්ධතිය සමඟ අදාළ තොරතුරු සන්සන්දනය කිරිමේදී සාවද්‍ය තොරතුරු සපයා ඇති බවට අනාවරණය වුවහොත් ඒ පිළිබදව දැඩි ක්‍රියාමාර්ග ගැනිමට සිදුවන බවද දන්වමි.

05.ඉහත උපදෙස් අනුව කටයුතු කිරිමෙන් 2026

වර්ෂයේ ගුරු ස්ථාන මාරු ක්‍රියාවලිය සාර්ථක කර ගැනීමට ඔබ ලබා දෙන සහය අතිශය අගය කරමි.

එච්.ඒ.කේ.යූ.අයි.හෙට්ටිආරච්චි
ශ්‍රී.ලං.අ.ප.සේ - 1
නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (පාලන) (රා.ආ)
කලාප අධ්‍යාපන කාර්යාලය
[illegible]
කොළඹ 02.

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ

පිටපත්

01.බස්නාහිර පළාත් අධ්‍යාපන ලේකම්-කරු:දැ:ගැ:ස

02. බස්නාහිර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ- කරු:දැ:ගැ:ස

03.සියලු ගුරු වෘත්තීය සමිති ලේකම්වරුන් වෙත- කරු:දැ:ගැ:

04.ස්ථාන මාරු ගොනුව

ඇමුණුම 03

## ගුරු තොරතුරු පත්‍රිකාව

පාසලේ නම:----------------------------------

පාසල් වර්ගය: 1/AB/1C/2/3

කොට්ඨාසය:............................................

පාසල් සංගණන අංකය-

(පාසලේ සේවා කාලය අනුව වැඩිම සේවා කාලයේ සිට අඩුම සේවා කාලය දක්වා සදහන් කල යුතුයි)

| අනු අංකය | ගුරු භවතාගේ සම්පූර්ණ නම | ස්ත්‍රී/පුරුෂ භාවය | ස්ථිර පදිංචි ලිපිනය | උපන් දිනය | 2025.12.31 දිනට වයස | උගන්වනු ලබන මාධ්‍ය | පත්වීම් විෂය | උගන්වනු ලබන විෂය | උගන්වනු ලබන ශ්‍රේණිය | ඉගැන්විය හැකි වෙනත් විෂයන් | මෙම පාසලට පත් වූ දිනය | මෙම පාසලේ සේවා කාලය(2025.12.31 දිනට | පෙර සේවය කල පාසල | දුරකථන අංකය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |

ඉහත ගුරු තොරතුරු සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි.

............................

නියෝජ්‍ය විදුහල්පති

........................

විදුහල්පති

(අත්සන හා නිල මුද්‍රාව)

*මෙය ආකෘතියක් පමණි.

*මෙය අනුව පාසලේ සියලුම ගුරු භවතුන්ගේ තොරතුරු ඇතුළත් කරන්න.